සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

අවසාන වාර ඇගයීම
ஆண்டு இறுதி மதிப்பீடு - 2019
Year End Evaluation

ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ගෘහ ආර්ථික විද්‍යාව - පිළිතුරු | පත්‍රය / வினாத்தாள் / Paper | පැය / மணித்தியாலம் / Hours

# I පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1 -3 | 11 – 1 | 21 – 4 | 31 – 2 |
| 2 – 2 | 12 – 2 | 22 – 2 | 32 – 2 |
| 3 – 4 | 13 -4 | 23 – 2 | 33 -1 |
| 4 – 1 | 14 – 2 | 24 – 2 | 34 – 3 |
| 5 – 2 | 15 – 3 | 25 – 3 | 35 – 3 |
| 6 – 4 | 16 – 2 | 26 – 3 | 36 – 2 |
| 7 – 2 | 17 – 4 | 27 – 4 | 37 – 1 |
| 8 – 4 | 18 -3 | 28 – 3 | 38 – 3 |
| 9 – 1 | 19 – 4 | 29 – 4 | 39 – 3 |
| 10 - 3 | 20 - 3 | 30 - 2 | 40 - 3 |

(ලකුණු 01 X 40 = මුළු ලකුණු 40)

# II පත්‍රය

1. i. කඩල,මෑ ඇට, බෝංචි ඇට, කව්පි ඇට, මුං ඇට (වර්ග 4 ට ලකුණු 02)

ii.

- ගම්මිරිස් බීජවලට ගස්ලබු බීජ මිශ්‍ර කිරීම.
- කිතුල් පැණිවලට කරකරන ලද සීනි,ඉදුණු ලාවුළු, හුඹස් මැටි මිශ්‍ර කිරීම.
- අබ බීජවලට කුරක්කන් බීජ මිශ්‍ර කිරීම.
- කුරක්කන් පිටි, කිතුල් පිටිවලට ඩයියොදන ලද තිරිඟු පිටි මිශ්‍ර කිරීම.
- කිරිවලට ජලය මිශ්‍ර කිරීම.
- මිරිස් කුඩුවලට තිරිඟු පිටි සහ ඩයි මිශ්‍ර කිරීම.
- තේ කුඩුවලට කසල තේ සහ වර්ණක මිශ්‍ර කිරීම.
- කහ කුඩුවලට ඩයි දමන ලද තිරිඟු පිටි මිශ්‍ර කිරීම. (කරුණු 4කට ලකුණු 02)

iii.

- රුචිය වඩවන ආහාර එක් කිරීම.
- විවිධත්වයෙන් (වර්ණ,රසය, වයනය) යුතු වීම.

- දෛනික පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා කුඩා ආහාර වේල් කිහිපයක් ලබා දීම.
- ලුණු, සීනි භාවිතය අවම කිරීම. (කරුණු 02ට ලකුණු 02)

iv. $-18^{0}C$ අඩු හා $4^{0}C$ $-8^{0}C$ අතර (ලකුණු 02)

v. තෙතමනය අවශෝෂණයේ කළ හැකි වීම.
සේදීමට හා වියලීමට ඔරොත්තු දිය හැකි වීම.
මැදීමට ඔරොත්තු දිය හැකි වීම.
සැහැල්ලු හා විවිධ වර්ණවලින් යුත් කුඩා මෝස්තර සහිත රෙදි වීම.
(ලකුණු 02)

vi. පතරොම සහිතව කපාගත් ඇඳුමේ කොටස් යටින් සන්නාලි කඩදාසිය තබා, පතරොමහි ඇති රේඛාව මත පමණක් දක්කු රේඛා සලකුණු කරන්න.
පතරොම ඉවත් කර ඇඳුමට අල්පෙනෙති ගසා, පෙර සලකුණු කරගත් දක්කු රේඛා මත නැවතත් දක්කු රේඛා සලකුණු කරන්න.
(ලකුණු 02)

vii. ළදරුවාගේ අස්ථි හා මාංශපේශී වර්ධනය වීම තුළින් ඒවා මනාව පාලනය කරමින් චලනය කිරීමේ හැකියාව චාලක වර්ධනය ලෙස හඳුන්වයි. ළදරු අවධියේ දී චාලක වර්ධනය ශීඝ්‍රයෙන් සිදුවේ.
(ලකුණු 02)

viii. පරිපූරක ආහාරයක් සැකසීමට අවශ්‍ය ද්‍රව්‍ය
- සහල් (කැකුළු)
- පලා වර්ගයක්
- කැරට්/වට්ටක්කා කැබැල්ලක්
- හාල් මැස්සන් 3, 5ක්
- අලගෙඩියක්
- බෝංචි කරල් දෙකක් (කරුණු 4කට ලකුණු 02)

ix.
- නිරවුල් මායිම් තිබීම.
- නිරවුල් භුක්තියක් තිබීම.

- භූමියට අවතීර්ණ වන මාර්ගයක් තිබීම. (කරුණු 02ට ලකුණු 02)

x.

- ශබ්ද දූෂණ අවම ප්‍රදේශයක් වීම.
- අධික දූවිලි දුම්වලින් තොර ප්‍රදේශයක් වීම.
- අපද්‍රව්‍ය කැලිකසල රැස් කරන ස්ථානයකට ආසන්න නොවීම.
- අසල් වැසියන්ගේ අනවශ්‍ය බලපෑම්වලින් තොරවීම.
- ආලෝකය හා වාතාශ්‍රය බාධාවකින් තොරව ලැබෙන ඉඩමක් වීම.

(කරුණු 02ට ලකුණු 02)

(මුළු ලකුණු 20)

2. i.

- ඇඳුම් ලිහිල් වීම.
- සරල පන්නයකින් යුක්ත වීම.
- ඇඟලෑමට හා පියවීමට පහසු වීම.
- මූට්ටු අවම වීම.
- මූට්ටුවක් යොදන්නේ නම් ඒ සඳහා පැතලි මූට්ටුම යෙදීම.
- විවර පියවීමට ටේප් ඇල්ලීම.
- අලංකාර කිරීම සඳහා සරල මෝස්තර හා විසිතුරු මැහුම් ක්‍රම යොදා ගැනීම

(කරුණු 03ට ලකුණු 03)

ii. A - පපුව ඉදිරි පස

60÷2= 30+1=31÷2=15.5+1=16.5cm (ලකුණු 1½)

B - ඉන ඉදිරිපස

55÷2=27.5+1=28.5÷2= 14.25+1=15.25 cm ( ලකුණු 1½)

(ලකුණු 03)

iii. ළමා ගවුම් පන්න දෙකක් රූපසටහන් මගින් දක්වා විසිතුරු කිරීමට සුදුසු උපාංග 4 ක් නම් කිරීම

(ලකුණු 02)

(මුළු ලකුණු 10)

3.

- පාරිභෝගික ආරක්ෂණ පනත් පිළිබඳව දැනුවත් වීම.
- ආහාරවල ප්‍රමිතිය පිළිබඳව දැනුවත් වීම.

- නිසි ප්‍රමිතියෙන් යුත් ආහාර තෝරා ගැනීමට උනන්දු වීම.
- ආකර්ෂණීය ආහාරවල ඇසුරුම් විවිධ වෙළද ප්‍රචරණය හා අලෙවිකරුවන් සිදු කරන රැවටීම් ආදියට හසු නොවීම.
- ක්ෂණිකව ඉදවන ලද පළතුරු හඳුනා ගත හැකි වීම.
- මිල අඩු පෝෂණමය අගයෙන් ඉහළ ආහාර පිළිබඳව දැනුවත් වීම.
- පරිරක්ෂක හා ක්ෂණික ආහාරවලින් ඉවත්ව ස්වභාවික ආහාර වෙත යොමු වීම.

(කරුණු 3ට ලකුණු 03)

ii. (a) මිටිබව - කාලීන මන්ද පෝෂණයේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවේ.
වයසට සරිලන උස නොමැති වීම.
(ලකුණු 1½)

(b) ක්ෂය වීම - (තීව්‍ර මන්ද පෝෂණයේ ප්‍රතිඵලයක් ලෙස ඇති වේ.) උසට සරිලන බර නොමැති වීම.
(ලකුණු 1½)

(ලකුණු 03)

iii.

- උස වීදුරුවක් වීම හා එය පිටත වියලි වීම.
- වීදුරුවේ ඉහළ මායිමේ සිට ½'' ක් පහළින් වතුර පිරවීම.
- වතුර පිරිසිදු වීම.
- වියලි පීරිසියක්, තසිමක් මත වතුර විදුරුව තැබීම.
- පීරිසිය දෙපසින් අල්ලා වතුර වීදුරුව පිළිගැන්වීම. (වීදුරුව නොඅල්ලා)
- අයිස් වතුර පිළිගන්වන විට Paper serviette එකක් තැබීම හෝ අත් පිස්නාවක්

.

(කරුණු 04ට ලකුණු 04)
(මුළු ලකුණු 10)

4. i.

- ආහාර පිළිගන්වන ස්ථානයේ පවිත්‍රතාව
- ආහාර පිළිගැන්වීමට භාවිත කරන උපකරණ මෙවලම් සහ ද්‍රව්‍යවල පවිත්‍රතාව
- ආහාර පිළිගන්වන්නාගේ පවිත්‍රතාව සහ නිරෝගී වීම.
- ආහාර අලංකාරව සහ ප්‍රියජනක ලෙස පිළිගැනීම.
- ආහාර ගන්නා තැනත්තා අපහසුතාවයට පත් නොවන පරිදි ආහාර පිළිගැනීම.

(කරුණු 03ට ලකුණු 03)

ii. යකඩ,තඹ, ෆෝලික් අම්ලය,විටමින් C, ප්‍රෝටීන්,කෝබෝල්ට්, විටමින් $B_{12}$

(කරුණු 6ට ලකුණු 03)

iii.

- ළදරුවන්ට මුල් මාස 06 තුළ මව්කිරි ලබා දීම.
- ගුණාත්මක හා ප්‍රමාණාත්මක බැවින් යුතු අතිරේක ආහාර ලබා ගැනීම.
- ගැබිනි හා ක්ෂීරණ මව්වරුන් සායනවලට සහභාගි කිරීමට උනන්දු විම.
- ආසාදන රෝග මැඩපැවැත්වීමට කටයුතු කිරීම.
- පෝෂණය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම.
- පණු ආසාදන සඳහා පණු ප්‍රතිකාර ලබා දීම.
- අඩු ආදායම්ලාභී අඩු පෝෂණතාව ඇති අය හඳුනා ගෙන පෝෂණ පරිපූරක ලබා දීම හා ඒවා නිවැරදිව ආහාරයට ගැනීමට මඟ පෙන්වීම.
- ළමුන්ට සුදුසු , මිල අඩු, පෝෂ්‍යදායී, සෞඛ්‍යාරක්ෂිත ආහාර ප්‍රචලිත කිරීම.
- ප්‍රතිශක්තිකරණ නිසි ලෙස ලබා දීම. (කරුණු 4කට ලකුණු 04)

(මුළු ලකුණු 10)

5. i.

- සියලුම ආදායම් මාර්ගවලින් ලැබෙන මුදල් ප්‍රමාණය
  උදා: වැටුප්, පොළී, බදු
- පවුලේ සාමාජික සංඛ්‍යාව හා ඔවුන්ගේ අවශ්‍යතා
- පවුලේ අත්‍යවශ්‍ය වියදම්
  උදා: ආහාරපාන, ප්‍රවාහන අධ්‍යාපන කටයුතු
- අතිරේක වියදම්
  උදා: විනෝද කටයුතු, උත්සව අවස්ථාව
- ඉතිරි කිරීම
  උදා: බැංකු ගිණුම්, සුරකුම් පත් (කරුණු 03ට ලකුණු 03)

ii.

- මැද මිදුල හා පොකුණු
- යකඩ /කොන්ක්‍රීට් ග්‍රිල්
- වහලේ හැඩයට සිලීම යෙදීම.
- විනිවිද පෙනෙන ප්ලාස්ටික් පොලිකාබනේට් හෝ ෆයිබර් වැනි ආවරණ තහඩු
- වහලේ උස වැඩි කිරීම.

- වීදුරු /ගඩොල්
- වහලේ කවුළු යෙදු උළු කැට/විදුරු උළුකැට (කරුණු 06ට ලකුණු 03)

iii. <u>**බහු කාර්යය උපකරණ**</u> <u>**බහු කාර්ය ඒකක**</u>

- කණ්නාඩිය සහිත අල්මාරිය මුළුතැන්ගෙය කෑම ගැනීම හෝ ආහාර ගබඩා කිරීම.
- කබඩ් සහිත ඇඳ විසිත්ත කාමරය - පාඩම් කිරීම / කෑම ගැනීම
- ඩිවානය නිදන කාමරය - පාඩම් කිරීම හා නිදා
  කබඩ් සහිත රෙදි මදින මේසය ගැනීම
- සපත්තු රඳවනය සහිත රෙදි රාක්කය කෑම කාමරය - පාඩම් කිරීම හා කෑම ගැනීම

(ලකුණු 04)

(මුළු ලකුණු 10)

6. i. එන්නත - B.C.G
   රෝගය - ක්ෂය රෝගය
   කාලය - ඉපදී මුල් පැය 24 ඇතුලත)

(ලකුණු 03)

ii. මානසික වර්ධනය - ආදරයෙන් සුරතල් කිරීම.
දරුවා සමඟ අදරයෙන් කතා කිරීම.
ආදරයෙන් තුරුලු කර ගැනීම.
ආදරයෙන් සිප ගැනීම.

භාෂා වර්ධනය - නැළවිලි ගීත ගැයීම.
කතන්දර කියා දීම.
සරල වචන භාවිතයට උනන්දු කරවීම.

චිත්තවේග වර්ධනය - පරිසරය නැරඹීමට අවස්ථාව ලබා දීම.

පරිසරයේ වෙනස්කම් පෙන්වා දීම.

සමාජ වර්ධනය - සාමාජිකයින් නිතර දරුවා සමඟ කථා කිරීම.
කුඩා දරුවන්ගේ ඇසුර ලබා දිම.
ඥාතීන් අතරට ගෙන යාම. (ලකුණු 03)

(iii) a. මොරියුලාව

පරිණත ඩිම්බයක් හා සජීවී ශුක්‍රාණුවක් එකතු වී සංසේචනය සිදුවීමෙන් පසු සෑදෙන යුක්තානුව සෙල 2,4,6,8 ආදී ලෙස අඛණ්ඩව දෙකට බෙදීමෙන් සෙල ගොනුවක් සෑදේ. මෙම සෙල ගොනුව මොරියුලාව ලෙස හඳුන්වයි.

( ලකුණු 02)

b. අධිරෝපනය

ඉහත සඳහන් කල පරිදි සෙල ගොනුව හෙවත් මොරියුලාව, පැලෝපීය නාලය දිගේ ගර්භාෂයට පැමිණ ගර්භාෂයේ එන්ඩොමෙට්‍රියම තුළ ගිලී සවිවීම අධිරෝපනය ලෙස හඳුන්වයි.

( ලකුණු 02)

( මුළු ලකුණු 10)

7. i.

- අධ්‍යාපනය කඩාකප්පල් වීම
- අනාගතය අසාර්ථක වීම
- සමාජ අවමානයට ලක්වීම.
- විවාහවීමට බාධා වීම හා ප්‍රතික්ෂේප වීම. (අනාගතයේ දී)
- සමාජයට මුහුණ දීමට ඇතිවන භය හා ලජ්ජාව
- නිවස හා තම ජීවත්වන පරිසරයේ දී ගැටලු ඇතිවේ.
- HIV ආසාදනය ඇතුළු ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග වැළදීම.

(ලකුණු 03)

ii.

- සමවයස් කාණ්ඩායම්වල බලපෑම
- පවුලේ බලපෑම
- පාසලේ දී විවිධ වගකීම් පැවරීම් අනුව
- දෙමාපියන්ගේ බලපෑම
- විවිධ සමිති සමාගම්වල බලපෑම
- නෑදෑහිත මිත්‍රාදීන් සමඟ ඇති බැදීම.

(ලකුණු 03)

iii. රූප සටහන ඇඳීමට ලකුණු ½, කොටස් 7ක් නම් කිරීමට ලකුණු 03 ½ ක් ලෙස

- ගර්භාෂය
- පැලෝපීය නාල
- ඩිම්බකෝෂ
- යෝනි මාර්ගය
- ගර්භාෂ බිත්ති
- ඇඟිලිවැනි ප්‍රසර
- ගැබ්ගෙල (ලකුණු 04)

(මුළු ලකුණු 10)